ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යතුමිය සහ ඉන්දීය මහ කොමසාරිස්තුමා අතින් ශ්‍රී සෝභිත නාහිමි ගම ජනතා අයිතියට පත් කෙරේ**

2025 ජූලි 12 වන දින ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිනිය සහ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ශ්‍රී සෝභිත නාහිමි ගම ව්‍යාපෘතිය යටතේ ඉන්දීය ආධාර ඇතිව ඉදි කළ නිවාස ප්‍රතිලාභීන් වෙත භාර දෙන ලදී.

2. නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය ආචාර්ය අනුර කරුණාතිලක; වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ; නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස නියෝජ්‍ය අමාත්‍ය ටී. බී. සරත්; පාර්ලිමේන්තුවේ හිටපු කතානායක කරු ජයසූරිය; පාර්ලිමේන්තු මන්ත්‍රී සේන නානායක්කාර; අනුරාධපුර දිස්ත්‍රික් ලේකම්තුමා; සෝභිත හිමි පදනමේ සභාපති රවි ජයවර්ධන යන මහත්වරුන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් මෙම උත්සවයට සහභාගී වූහ.

3. මෙම අවස්ථාව අමතමින් මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා දෙරට ජනතාවගේ සුබ සිද්ධිය උදෙසා ඉන්දීය රජයේ සහ ශ්‍රී ලංකා රජයේ කැපවීම අවධාරණය කළේය. දෙරටම මනා ලෙස එක හා සමපාත වන ප්‍රවේශයන්ගෙන් මෙම අරමුණ කරා යන බව ප්‍රකාශ කළ මහ කොමසාරිස්තුමා ඉන්දියාව ‘සබ්කා සාත්, සබ්කා විකාස්’ යන ආදර්ශ පාඨය සහිතව ‘වික්සිත් භාරත්’ වෙත ගමන් කරන බව ද ශ්‍රී ලංකාව ‘පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්’ වෙත ගමන් කරන මාර්ගයකට පිවිස ඇති බව ද සඳහන් කළේය. මහව - අනුරාධපුර දුම්රිය මාර්ගය සඳහා ඉන්දීය ආධාර යටතේ සංඥා පද්ධතියක් ස්ථාපනය කිරීම සහ මහව - ඕමන්තේ දුම්රිය මාර්ගය නවීකරණය කිරීම වැනි ඉන්දියාව විසින් අනුරාධපුරයේ ක්‍රියාත්මක කර ඇති විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් මෙන්ම පූජා නගර සංකීර්ණයක් සංවර්ධනය කිරීම වැනි සිදු කිරීමට නියමිත ව්‍යාපෘතීන් පිළිබඳව සඳහන් කරමින් එතුමා දෙරටෙහි අන්‍යෝන්‍ය සුබ සිද්ධිය උදෙසා ද්විපාර්ශ්වික සම්බන්ධතාවයේ සියලු අංශයන් තුළ ශ්‍රී ලංකාව සමඟ කටයුතු කිරීමට ඉන්දියාවේ කැපවීම අවධාරණය කළේය.

4. මෙම අවස්ථාව අමතමින් ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිනිය සමාජ සාධාරණත්වය වෙනුවෙන් කැප වී කටයුතු කළ පූජ්‍ය සෝභිත හිමියන්ගේ ඉගැන්වීම් සිහිපත් කළ අතර ජනතාවට මහත් සේ සෙත සලසන ශ්‍රී සෝභිත නාහිමි ගම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉන්දීය රජයට සහ ජනතාවට සිය ස්තූතිය පළ කළාය. මෙම

අවස්ථාව අමතමින් නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය ආචාර්ය අනුර කරුණාතිලක සහ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ මහතා ව්‍යාපෘතිය සඳහා ලබා දුන් මූල්‍ය සහයෝගය වෙනුවෙන් ඉන්දීය රජයට සිය කෘතවේදිත්වය පළ කළේය.

5. නිවාස 115ක් ද අනුරාධපුර ඇලපත්ගම ගම්මානයේ පදිංචිකරුවන් සඳහා වෙනත් යටිතල පහසුකම් ද ඉදි කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. උතුරු මැද පළාතේ දුගී ගම්මානවල ජනතාවගේ ජීවිත නඟා සිටුවීමේ අපවත් වී වදාළ සෝභිත හිමියන්ගේ දැක්ම අනුව මෙම ව්‍යාපෘතිය පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමි අනුස්මරණ පදනමේ ඉල්ලීමක් අනුව ක්‍රියාත්මක කරන ලදී. නව පහසුකම් සහිත ගම්මානය ශ්‍රී සෝභිත නාහිමි ගම්මානය ලෙස නම් කර ඇත.

6. 2017 ජූලි මාසයේදී ඉන්දීය රජය සහ ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී. ගිවිසුමේ සංශෝධිත රාමුව අනුව ඉන්දීය රජය නිවාස 90 සඳහා සිය මූල්‍ය සහයෝගය ශ්‍රී ලංකා රුපියල් මිලියන 450කට අධික ප්‍රමාණයක් දක්වා ඉහළ නැංවූ අතර ශ්‍රී ලංකා රජය විසින් නිවාස 25ක්, භික්ෂු නිවාසයක් සහ පුස්තකාලයක් වැනි වෙනත් පහසුකම් ඉදි කරන ලදී. එම නිවාස 25, භික්ෂු නිවාසය සහ පුස්තකාලය 2024 අප්‍රේල් මස ජනතා අයිතියට පත් කරන ලද අතර මේ අනුව ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන්ම අවසන් කර තිබේ.

****

කොළඹ
2025 ජූලි 12